

# මම ලියන්නේ මගේ සතුටට.

## ප්‍රංශ පෙම්වතා ගෙන ආ ශමෙල් ජයකොඩි



සාකච්ඡා කළේ
උපේක්ෂා සේනානායක

අනවරථ ලේඛනයේ යෙදෙන්නෙකුට කියවීම තරම් තවත් අභ්‍යාසයක් නැති තරම්ය. කියවීම තුලින් ලේඛකයා ලබන ආනන්දය සහ අවබෝධය ලේඛකයා තුල පවතින ශක්‍යතාව ත්‍රීව්‍ර කරන ඖෂධයක් හා සමානයි. මෑතකදී මගේ අතට පත්වුණ "ප්‍රංශ පෙම්වතා" කෘතිය කාලයක් තිස්සේ මා වෙතින් යටපත් වෙමින් පැවති කියවීමේ පුරුද්ද යළි ඉස්මතු කරමින් පොත් සොයා යමින් කියවීමට තරම් මා නැවතත් ප්‍රහර්ෂයට පත්කළ අමුතු පොතක් බව මම කියමි.

මාලක නම් මානවකයා ප්‍රංශයට පමණක් සීමා වූ පෙම්වතකු නොව මෙල්බර්න් නුවරු අතරිනුත් මට සොයා ගත හැකි පොදු පෙම්වතකු බව මම පසක් කළෙමි. මේ පොදු සංක්‍රමණික පෙම්වතා සාහිත්‍ය ලෝකයට රැගෙන ආ ශමෙල් ජයකොඩි නම් වූ ඇය පිළිබඳව මා තුල ඇතිවූ අප්‍රමාණ පැහැදීම ඇගේ විද්‍යුත් ලිපිනය සොයා ගැනීමෙන් අවසන් වූයේ නැත.

මම ඇගේ ආත්මය තුල වූ අව්‍යාජ ගැහැණිය පිළිබඳව කැණීම් කරන්නට පටන් ගතිමි. එසේ ගොඩගත් කරුණු සියල්ල පත්තර පිටුවකට ගොනු කරගැනීම මේ සාහිත්‍ය මාසයේ මගේ මූලික අරමුණ විය.

කැනඩාව සහ ඔස්ට්‍රේලියාව අතර දේශාංෂ හරහා හුවමාරු වූ විද්‍යුත් ලිපි මගින් අප දෙදෙනා අතර බෙදා ගත් මනුශ්‍යත්වයේ සටහන් පෙළ කියවා බැලීමට ඔබට ඉඩ හරිමි.

### ඔබ කිසියම් ලේඛන හැකියාවක් ඇති දැරියක බව ප්‍රකට කළ, ඔබට සිහිපත් වන පළමු සිදුවීම කුමක්ද?

පාසල් වියේ පටන් මම චෙස් ක්‍රීඩාවට ඇබ්බැහිව සිටියා. මට හුඟක් මිතුරියන් සිටියා. ඔවුන් හා කාලය ගෙවා දැමීමට මම ඉගෙනීමටත් වඩා තැන දුන්නා. ඒ වගේමයි පත පොත කියවීම. මේ හේතු නිසා නිර්මාණකරණයට තදබලව එකතු වෙන්න හිත යොමු වුණේ නැහැ. මට පාසල් ගණනාව කට යන්න සිද්ධ වුණා. උසස් පෙළට පෙනී හිටියේ කුරුණෑගල මලියදේව බාලිකාවෙන්.

මම විදේශගතව, බිරිඳක්, මවක් විදිහට මගේ ජීවිතය ආරම්භ කළ මුල් කාලයේම තමයි මගේ පළමු නවකතාව ලියුවේ. එහි නම 'රෝසමාලී'. එයට පාදක වුණේ ලංකාවේ මගේ ළමා විය, පාසල් කාලය. මම හිතනවා එය තමයි මා මේ ක්ෂේත්‍රය තුළට කා වද්දපු නවකතාව. එය කියවපු පාඨක පිරිස ඒ පොතට ඇදී ගියා. එය සම්මාන උළෙලවලට නිර්දේශ වුණු පසු මට නවකතා ක්ෂේත්‍රය තුළ ස්ථාවර බවක් ලැබුණා.

### ඔබ කුඩා කළ මහත් අභිරුචියකින් කියවූයේ කුමන ආකාරයේ පොත පතද?

මම ගමේ පුස්තකාලයෙන් පොත් කියවපු කෙනෙක්. ඒක මම ආඩම්බරයෙන් කියන දෙයක්. පුස්තකාලවල ඒ කාලයේ සුලබ සෝවියට් පරිවර්තන. මම කුඩා වියේ පටන් ඊට වඩා වැඩි වයසකට ලියවුණු පත පොත පුස්තකාලයෙන් කියෙව්වා. අසුවෙන ඕනෑම පොතක් කියෙව්වා කීවොත් නිවැරදියි. මට තාමත් මතකයි මම පොතක් අරගෙන පුස්තකාලයාධිපති ගාවට පොත මගේ නමට ගන්නට බයෙන් යන හැටි. මම ගෙනියන පොත් ගැන කාට හෝ පැමිණිලි කරයි කියලා. එහෙම අරගත්ත බොහොමයක් පොත් ගෙනගියාට කියවන්න බරපතල වැඩියි. සමහර ඒවා කියෙව්වාට තේරුණේ නැහැ. මේ මට වඩා හුඟාක් ඉහළින් තිබුණු ලෝකය අතගෑම තුළ තිබෙන අවිධිමත් අධ්‍යාපනය තමයි මගේ ජීවිතය දැන් තිබෙන තැනට එනතුරු හැඩගැස්සුවේ.




### ළමාවියේ සිට ප්‍රගුණ කළ කියවීම ඔබේ වර්ථමාන සාහිත්‍යකරණයට බලපෑවේ කෙසේද?

කුඩා වියේ පටන් කියවීමට නැඹුරුවීම මාව ලේඛිකාවක් කරා තමයි. ඒත් ඒ කියවපු දේවල් අද මා ලියන දේවල්වලට සම්බන්ධයක් නැහැ. මම සෝවියට් පරිවර්තන කියෙව්වාට මගේ නවකතා ඊට හාත්පසින් වෙනස්. කියවීම තුළින් අපි අපිට අසු නොවෙන ලෝකවල් අත්දකිනවා. කියවීම අපිව තෘප්තිමත්ව තබනවා වගේම එය අපිව ලෝකයට විවෘත කරනවා. එකවර ලෝක දෙක තුනක ජීවත් වෙන්නට හැකි පුළුල් පරාසයක් ගොඩ නගනවා. ඕනෑම අත්දැකීමක් සතුටින් පිළිගන්නට අපව සූදානම් කරනවා.

මගේ සාහිත්‍යකරණයට බලා පෑ දේ තමයි මගේ අත්දැකීම්. පාසල් කාලය, විශ්වවිද්‍යාලයට යන්නට කලින් මා ගණිත ගුරුවරියක් විදිහට පාසලක ඉගැන්වුව කාලය, සරසවි ජීවිතය, ඉංජිනේරුවෙකු ලෙස රැකියාව කිරීම. මේ කාලය පුරා ලංකාවේ නොයෙන් පැතිවල ජීවත්වීම තමයි මගේ ලිවීම හැඩගැස්සුවේ. පසුකාලයක අපි ලබන අත්දැකීම් අප කියවන පොත පතේ තියෙන ලෝකය අබිබවා යන යුගයක් එනවා. වර්තමාන සාහිත්‍යකරණයට බලපෑවේ ළමා වියේ සිට කියවීමද, කියවීම තුළින් දුටු ලෝකය පසුකාලයක සැබෑ අත්දැකීම්වලින් අතික්‍රමණය කිරීමද කියන එක මට පැහැදිලිව කියන්න බැරි දෙයක්.

### කියවීම සහ ලේඛනය අතර පවතින අනවරථ සම්බන්ධයට ඔබ ලබාදෙන අර්ථකථනය කවරක්ද?

කියවීමට හුරු වුණු හැම කෙනෙක්ම ලේඛනයට යොමු වෙන්නේ නැහැ. ඒ වගේමයි ලේඛනයට යොමු වුණත් ඒ ඔස්සේ දිගටම යන්නට අවස්ථාව උදා කර ගන්නේ නැහැ. අහඹු සිදුවීම් වැළක එකතුවකින් තමයි කියවන කෙනෙක් ලේඛනයට සම්බන්ධ වෙන්නේ. මම හිතන්නේ පොතක් කියවද්දී අපි එයින් ලබන රසය, ඒ පොත කෙරෙහි අප ඇති කර ගන්නා සුහදශීලී මිත්‍රකම ලේඛකයෙකු ලෙස පෙරළා සිදු කිරීමයි අපි අපේක්ෂා කරන්නේ. මගේ පොතකින් පාඨකයා ලබන රසය, එහි චරිත හා ඔවුන් ඇති කර ගන්නා ආත්මීය බැඳීම මාව සතුටට පත් කරන්නක්. ඒ සතුට ගැන මම හොඳකාරව දන්නේ පොතපත පරිශීලනය තුළින්මයි.

### ඔබේ නිර්මාණ තුළින් වඩාත් ඉස්මතු වන්නේ ඔබද? නැතහොත් පොදු සමාජ යාන්ත්‍රණය තුල ඔබට පැවරී තිබෙන වගකීමද?

මගේ නිර්මාණ තුළින් වඩාත් ඉස්මතු වන්නේ මා පමණයි. ලිවීම සම්බන්ධයෙන් නම් මට අයත් සමාජ වගකීමක් ඇතැයි මා සිතන්නේ නැහැ. මමත් මගේ පාඨකයින් වගේම ජීවිත අරගලයක යෙදෙන කෙනෙක් පමණයි. සමහර වෙලාවට මට දැනෙනවා ගමක ඉපදිලා ගැහැනු ළමයෙකු විදිහට අධ්‍යාපනයේ කඩයිම් පැනීමට මා ගත් උත්සාහයේදී නම් අනෙත් අයට වඩා මට ජීවිතයේ ගැහැට විඳින්නට සිදු වෙන්න ඇති කියා. ඒ අතින් බැලුවාම මම අනෙත් අය තරම් වාසනාවන්ත කෙනෙක් නොවෙයි. ලිවීමෙන් පිටදී නම් මට මේ සමාජ යාන්ත්‍රණය තුළ වගකීමක් තියෙනවා. මම උත්සාහ දරනවා මේ පවතින තත්වය තුළ පවා සතුටින් සිටීමට ජීවිතයෙන් තෘප්තිමත් වීමට එය විචිත්‍රවත් කර ගැනීමට. සමහර විට මම ලිවීමෙන් කරන්නේ එය වෙන්න ඇති.

### නිර්මාණය සහ ඔබ එකිනෙකින් වියුක්ත වන්නේ කවර අවස්ථාවේද?

නවකතාවක් ලියද්දී ඒ තුළ මම ඉන්නවා. නමුත් එය කොහෙත්ම මගේ කතාව නම් නෙමෙයි. බොහෝ විට නිර්මාණය හා මා එකිනෙකට වියුක්ත වෙන තැනක් කියා නැහැ. මුළුමනින්ම, පටන් ගැන්මේ පටන්ම වියුක්තයි. නමුත් මගේ පොතක ඉන්නා චරිතවලින් කොටසක් මා මේ ලෝකය තුළ ගත කරන්නට කැමති චරිත. මුණ ගැසෙන්නට කැමති චරිත. එසේ මුණ ගැසුණු විට මගේ ජීවිතයේ කොටසක් වන්නට ඉඩ දෙන්නට කැමති චරිත. එය මම ඉස්මතු කරන්න කැමති චරිතයක් නම් මගේ කටින් පිටවෙන්නට ඉඩ ඇති වාක්‍ය තමයි ඔවුන් පවසන්නේ. ඒ වගේමයි අනෙත් චරිත මට මේ ලෝකය තුළ ජීවිතය ගැන පාඩම් කියා දුන් චරිත. ඒ වගේමයි මගේ නිර්මාණවල ඇති සිදුවීම් බොහෝ දුරට මා දැක ඇති, අසා ඇති, මගේ අවට සිදු වුණු සිදුවීම්.




නවකතාවක් ලියන්න පටන් ගැන්මේදී මගේ ළඟ තියෙන්නේ කතාවේ තේමාව ගැන දළ සැකැස්මක්. එහි අවසානය ගැනත් අපහැදිලි රූපයක් නමුත් නිශ්චිත හැඟීමක්. මේ අතර මම චරිත උපද්දනවා. කතාව තරමක් දුරට ආයාසයකින් ගෙතුණු පසුව එය ගලාගෙන යන්නේ මගේ අනුදැනීමකින් තොරව. උදාහරණයක් ගත්තොත් ප්‍රංශ පෙම්වතා හි මාලක, මාලි, තාරකා කියන චරිත ගොඩ නැගුණාට පස්සෙ ඔවුන් ඕනෑම සිද්ධියකදී කතාබහ කරන හැටි, ක්‍රියා කරන හැටි මගේ බලපෑමෙන් තොරයි. කොටින්ම කීවොත් ඉන්පසු කතාවේ චරිත විසින් කතාව ඇදගෙන යමක් සිදු වන්නේ. ඇත්තටම මේ කොටසටයි මම කැමති. කතාවේ චරිත මට පවා අභියෝග කරන වෙලාවට.

### දේශීය හෝ විදේශීය වශයෙන් ඔබ වඩාත් පරිශීලනය කරන පොත පත මොනවාද?

ඇත්තම කියන්න සාහිත්‍ය සම්බන්ධයෙන් හැදෑරීමක්වත්, පොත්පත් පරිශීලනයක්වත් මට නැහැ. මගේ පොත් ගැන ලිපියක් ලිවීමට කෙනෙක් අසන විට මම යම් අපහසුතාවයකට පත් වෙනවා. මොකද ඔවුන් මට සාහිත්‍ය ගැන මනා දැනුමක් ඇතැයි කියා සිතන බව මා දන්නා නිසා. මට සාමාන්‍ය පෙළින් පසු සිංහල, සාහිත්‍ය, ඉතිහාසය කියන විෂයයන් ඉගෙනීමේ අවස්ථාව ලැබුණේ නැහැ, ගණිත අංශය තෝරා ගත් නිසා. මම නිර්මාණකරණයට වැරදි දොරකින් ප්‍රවිශ්ට වුණු කෙනෙක් වගෙයි. ආපහු ගිහින් සාහිත්‍යයට පිවිසිය යුතු නිවැරදි දොර හොයාගෙන එයින් ඇතුළ් විය යුතුයි කියා මම දන්නවා. ඒත් මම කවදාවත් කිසිම දෙයක් සම්බන්ධයෙන් හරි දොරටුව හොයා ගත්ත කෙනෙක්වත්, ඒකෙන් ඇතුල් වෙන්න හිතන කෙනෙක්වත් නෙමෙයි.

මා අත්දැකීම්වලට පොත්පත් පරිශීලනයට වඩා වැඩි තැනක් දෙනවා. හැම තිස්සේම තෝරා ගන්නේ කවුරුවත් නොගිය මාවතක්. මා විශ්වාසය තබන්නේ එදිනෙදා ජීවිතය තුළ මා ලබන, අසන, දකින අත්දැකීම් කෙරෙහි පමණයි. කොහොමටත් මා සංචාරයට රුචිකත්වයක් දක්වන, ඕනෑම කෙනෙක් ඇසුරු කරන කෙනෙක්. මගේ වාසනාවට මට නිතරම මුණ ගැහෙන්නේ අපූර්වතම අය, මට වඩා විචිත්‍රවත් ජීවිත හිමි, මට හිතන්නට යමක් කියා දෙන අය. හරියට සාහිත්‍ය කියන දේ මා වටේ තියෙනවා වගේ. මට තියෙන්නේ බලාගෙන ඉන්න.

### ඔබ මේ දිනවල නිරත වී සිටින සාහිත්‍ය කටයුතු මොනවාද?

මා පොත් දෙක තුනක් එකවර තැනින් තැන ලියන කෙනෙක්. ඒ නිසා මට නිශ්චිතව කියන්න බැහැ මගේ ඊළඟ පොත මේක කියලා. එක පොතක සිදුවීම රසවත්නම් අහඹුව ඒ පොත වැඩියෙන් ලියවෙනවා. මම 'ඇමෙරිකා' පොත පටන් අරගෙන අවසාන කළත් ඒ පොත සංස්කරණය කරන්නට සූදානම් වෙද්දි මගේ හිතට 'ප්‍රංශ පෙම්වතා' කතාව ආවා. පුදුමෙකට වගේ මාස තුනක් තුළ මම ඒ කතාව එක හුස්මට එය ලියාගෙන ගිහින් ප්‍රකාශක අතට පත් කළා. පසුව තමයි මම 'ඇමෙරිකා' පොත ප්‍රකාශ කළේ. ඒ වගේමයි මම දැන් කාලයක් පුරා විදේශගතව සිටින නිසා ලංකාවේත් ඉන් පිටතත් මා ලැබූ අත්දැකීම් සම වෙලා තියෙන්නේ. එතනදී මම දෙපැත්තට දෝලනය වෙනවා. මම කැමතියි ලංකාවේ දෙයක් ලියන්න මොකද ඒක මගේ හිත අතීතයට, ළමාවියට යොවුන් වියට ගෙනියන විචිත්‍රවත් දෙයක් නිසා. ඒත් ලංකාවේ පිට අත්දැකීම් මෑත කාලීන නිසා ඒවායින් නිර්මාණයක් කිරීම වඩාත් පහසුයි.

### මවකගේ භූමිකාව තුළ සක්‍රියව කැපවීමෙන් ජීවත්වන ඔබ තම ලේඛණයට අවශ්‍ය ප්‍රස්තුත සොයා යන ගමන තුළ අත්දකින ප්‍රායෝගික අර්බුද මොනවාද?

මවගේ භූමිකාව පටන් ගැන්මත් සමගමයි මම මගේ පළවෙනි පොත අවසාන කරලා ලංකාවට ගිහින් පොත ප්‍රකාශන සමාගමකට බාර දුන්නේ. මගේ ජීවිතයේ දුෂ්කරම කාලයේ. ඒ ගැන අදටත් මම සතුටු වෙනවා.